# අර්හත් ධජය හෙවත් භික්ෂු චීවරය

නාරම්මල ධම්මිස්සර හිමි

භික්ෂූන් වහන්සේ නමක් හඳුනා ගැනීමට ඇති විශේෂ ලක්ෂණයකි උන්වහන්සේ පොරවාගෙන සිටින සිවුර. චීවරධාරී භික්ෂූන් වහන්සේ බෞද්ධ ජන හදවත් තුළ පමණක් නොව අන්‍යාගමික හදවත් තුළ පවා ඇති කරන්නේ ප්‍රසාදජනක හැඟීම් සමුදායකි. භික්ෂූන් වහන්සේගේ ඇඳුම් කට්ටලය අට පිරිකර නමින් හඳුන්වයි. එහි මුලින්ම ඇත්තේ තුන් සිවුරයි.

ප්‍රාග් බෞද්ධ යුගයන්හි පවා තවුසන්, පරිබ්‍රාජකයන් ආදී ආගමික ජීවිත ගත කළවුන් සිවුරට සමාන පැහැති වස්ත්‍රයක් දරන ලදැයි සිතීමට පුළුවන. සිදුහත් කුමරුන් දුටු හතරවැනි පෙර නිමිත්ත වූ කසාවත් පෙරවි ශ්‍රමණ රූපය මීට එක් නිදසුනක් වේ. එමෙන්ම යස කුල පුත්‍රයා පැවිදි වූ බව අසා,

**"යසො කිර කුලපුත්තො කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජිතො ති"** (මහාවග්ගපාලි, පබ්බජ්ජා කථා 38 පිට) යනාදි ලෙස ඔහුගේ යහළුවන් කළ කථාබහේදී සඳහන් වූ **කාසායානි වත්ථානි** යන්න එක පැවිද්දන් පාවිච්චි කළ වස්ත්‍රය ලෙස සැලකිය හැක. ප්‍රථම ධර්මදූත හැට නමට නොයෙක් පළාත්වලදී හමුවන සැදැහැතියන් පැවිදි කිරීමේදී කසාවත් පෙරවීමට කළ අනුදැනීම අනුව ද එකල ආගමික ජීවිත ගත කළ පුද්ගලයින් කසාවත් පරිභෝග කරන්නට ඇතැයි සිතිය හැක.

මෙලෙස බුදු සමයේ මුල් යුගයේදී භික්ෂූන් වහන්සේලා කාසාය වස්ත්‍රයම තම චීවරය ලෙස පරිබෝග කළත් පිරිස වැඩිවත්ම සිවුරු පිළිබඳව නොයෙක් වෙනස්කම් කරන්නටත් නොයෙක් පැහැති සිවුරු දැරීමටත් පටන් ගැනීම නිසා සිවුර පිළිබඳ ශික්ෂාපද පැනවීමට බුදුරජාණන් වහන්සේට සිදුවූ බව විනය පිටකයේ පොත්වලින් හෙළිවේ.

වරක් රජගහ නුවර සිට දක්ෂිණා ගිරියට වඩින අතරදී මහනියර හා කුඩානියර වලින් යුක්තව ඉතා ක්‍රමානුකූලව සකස් කර තිබූ මගධ කෙත දුටු බුදුරජාණන් වහන්සේ ඒ මගධ කෙත පිහිටා ඇති ආකාරයට සිවුරු ද කොටස්වලට කපා කඩ කඩ කොට මසා පරිබෝග කළ යුතු බව අනුදැන වදාළ අයුරු,

**"පස්සසි නො ත්වං ආනන්ද, මගධ ක්ඛෙත්තං අච්ඡිබද්ධං, පාලි බද්ධං මරියාද බද්ධං සිංඝාඨක බද්ධන්ති, එවං හන්තෙ ති. උස්සහසි නො ත්වං ආනන්ද භික්ඛූනං එවරූපානි චීවරානි සංවිදහිතුන්ති, උස්සහාමි භගවාති"**
(මහාවග්ගපාලි, චීවර බන්ධකය 708 සිට)

යන්නෙන් ඒ බව පැහැදිලිවේ. එතැන් සිට අද දක්වාමත් සිවුර සකස් වී ඇත්තේ මේ අනුවයි. සිවුරේ දික් අතට ගෙන බලන විටදී අඩුම ගණනේ තීරු පහකටවත් කඩා නැවත මූට්ටු කළ එකක් විය යුතුය. මෙසේ ඒ තීරු හෙවත් කඩ පහේ සිට ඉන් ඉහළට ඇති ඕනෑම ඔත්තේ ගණනක් අනුව සිවුර සකසා ගත හැකිය.

මේ තීරුවක් හඳුන්වන්නේ "අත්ත" යන නමිනි. මේ අත්තක් ද නැවත උඩ සිට පහලට කොටස්වලට වෙන් කරනු ලැබේ. අවසානයේ දී සිවුර මසා නිම කළ විට කුඩා කුඩා කැබලි එකතු කර ඇති බව පෙනේ. ජංගෙය්‍ය (කෙණ්ඩාපටි) ගීවෙය්‍ය (ගෙලපටි) ගණ්ඨ, නුවා යන කොටස් කීපයක්ම සම්පූර්ණ සිවුරක අඩංගු වේ.

වරෙක ඡබ්බග්ගිය භික්ෂූන් වහන්සේලා ලා රතු, නිල්, තද රතු, කළු, කොළ, ආදී නොයක් පාට ඇති සිවුරු හා මල්වැල් ලියවැල්, සත්වරූප ගෙතුම් ආදියෙන් අලංකාර කළ සිවුරුද පොරවා සිටිනු දුටු බුදුරජාණන් වහන්සේ එවන් සිවුරු පෙරවීම තහනම් කර වදාළ සේක. නූල් එල්ලෙන ලෙස කළ සිවුරුද හිස් වෙලුම් ද හැට්ට ද තහනම් කර වදාළහ.

**"අනුජානාමි භික්ඛවෙ ඡ චීවරානි, ඛොමං කප්පාසිකං කොසෙය්‍යං කම්බලං සාණං භාංගන්ති"**
(මහාවග්ගපාලි, චීවර බන්ධකය 698 සිට)

යනුවෙන් පට්ට වලින් කළ සිවුරු, කපු සිවුරු, පට සිවුරු, කම්බිලි සිවුරු, ගහ වැහැරි (නූල්) වලින් කළ සිවුරු ආදිය පාවිච්චි කිරීමට අනුදැන වදාළ සේක.

ගොම හා මැටි මිශ්‍ර කරගෙන සිවුරු පඬු පොවන බව දැනගත් බුදුරජාණන් වහන්සේ ගස්වල මුල්, දඬු, පොතු, කොළ, මල්, ගෙඩි යන වගී හය තම්බා ගත් වතුර පඬු වශයෙන් පාවිච්චි කිරීමට අනුදත්හ. බුදුරජාණන් වහන්සේ ඒවා අතරින් කහ අල, මදටිය දඬු, පිඩොල් දඬු, ලොත් සුඹුලු, කැල මල්, අල්ලි පත්‍ර යන වගී පාවිච්චි නොකරණ ලෙසද වදාරා තිබේ. සිවුරේ ආරක්ෂාවත්, පහසුවත් ක්‍රමානුකූලත්වයත් සඳහා පඬු ගැසීමේදී අනුගමනය කළ යුතු සික්ෂාපද කිහිපයක්ම පනවා ඇති බව **පාලිමුත්තක විනය විනිශ්චයෙහි** සඳහන්වේ. මෙසේ සකස් කළ සිවුරු පරිභෝග කිරීම පිළිබඳව ද පැනවූ ශික්ෂාපද රාශියක්ම දැකගත හැක. දිනක් විශාලාවේ ගෝතමක චෛත්‍යස්ථානයෙහි වැඩ විසූ බුදුරජාණන්

වහන්සේට රාත්‍රියේදී අධික සීතල නිසා සිවුරු කීපයක්ම පොරවන්නට සිදුවීම හේතු කොට ගෙන භික්ෂූන් වහන්සේලාට දෙපොට සිවුර, තනිපොට සිවුර, අඳනය යන **තුන් සිවුරු පරිබෝගය අනුදැන වදාළ අයුරු;**

**"අනුජානාමි භික්ඛවේ තිචීවරං, දිගුණං සංඝාටිං එකච්චියං උත්තරාසංගං එකච්චියං අන්තර වාසකන්ති"**

(මහාවග්ගපාලි, චීවර ඛන්ධකය 710 පිට)

යන පාඨයෙන් පැහැදිලි වේ. උපසම්පදා භික්ෂූන් වහන්සේ විසින් තුන් සිවුරු අධිෂ්ඨාන කොට පාවිච්චි කළ යුතු අතර එක් රැයක් හෝ තුන් සිවුරෙන් තොරව ගත කිරීමෙන් සිදුවන නිසඟි පචිතියෙන් පිරිසිදු වීමට නිස දෙසිය යුතුය. අතිරේක සිවුරක් දස දිනකට වඩා පාවිච්චි කරනවා නම් පරිෂ්කාර චෝලයක් වශයෙන් හෝ ඉටා ගත යුතුය. කඨිනයක් ලබාගත් භික්ෂූන් වහන්සේ නමකට එහි ආනිසංස වශයෙන් මාස හතරක් ඕනෑම සිවුරක් අදිටන් නොකොට පාවිච්චි කිරීමට ලැබීම විශේෂ වරප්‍රසාදයකි.

සිවුරු මනාකොට පොරවාගෙන වැඩහිඳීම හා ගමනේ යෙදීම ආදිය පිළිබඳ පැනවූ ශික්ෂාපද දහයක් සේඛියාවල පළමුවන පරිමණ්ඩල වර්ගයේ දැක්වේ. සිවුරු පොරවන සෑම වාරයක් පාසාම ප්‍රත්‍යවේක්ෂා කළ යුතු බව දැක්වෙන අතර පංසුකූල සිවුරේ පටන් සෑම සිවුරක්ම ඉතාමත් ආරක්ෂාකාරීව පිරිසිදුව හා ඉරී ඇත්නම් මසාගෙන හෝ පාවිච්චි කළ යුතු බවද දක්වා තිබේ. කැල්ලක් පිලිස්සී හෝ ඉරී ඇති විටෙක අණ්ඩයක් දමා සිවුර නැවත සකස් කරගත යුතුවේ. මෙසේ චීවරය පිළිබඳව ශික්ෂාපද රාශියක් පැනවීමෙන් බුදුරජාණන් වහන්සේ බලාපොරොත්තු වී ඇත්තේ නිරවුල්, පහසු, විවිධාකාර නොවූ හා ක්‍රමානුකූලව සකස් වූ ඇඳුමක් භික්ෂූන් වහන්සේගේ අල්පේච්ඡ, ශාන්ත ජීවිතය තව තවත් තැන්පත් කිරීමක් බව අපට සලකා ගත හැක. උන්වහන්සේගේ ඒ දූරදර්ශී ක්‍රියා මාර්ගය කොයි තරම් දුරට ඵලදරා ඇත්දැයි කියතොත් එදා සිට අද දක්වාමත් වසර දෙදහස් පන්සිය හැත්තෑපහක් තිස්සේ නොවෙනස්ව පවතින ඇඳුමක් ලෙස සිවුරට වැදගත් ස්ථානයක් හිමි වී ඇත.

● **ආශ්‍රිත ග්‍රන්ථ:**


මහාවග්ගපාළිය

පාළිමුත්තක විනය විනිශ්චය

ප්‍රාතිමෝක්ෂ විවරණය


ධෛර්යයෙන් ක්‍රියා කරන පුද්ගලයාට
දෛවයේ පහර නොවදී

(ශේක්ෂ්පියර්)

*உண்மை பேசி உத்தமனாக வாழ்*

ඇත්ත කියා උත්තම පුරුෂයෙකු ලෙස ජීවත්වන්න.

*நல்லா ரொருவர்க்குச்செய்த உபகாரம்*
*கல்மே லெழுத்து போட்காணுமே அல்லாது*
*ஈமேலா நெஞ்சத் தார்கீந்த உபகாரம்*
*நீர் மேலெழுத்திட்கு நேர்.* (முதுரை)

නැණැති දනන් හට මද ගුණයක් කළ ද
පවති ගල කෙටූ අකුරක් මෙන් නිබඳ
විමති දනන් හට කළ කිසි ගුණ නොමඳ
එ නැති වේය දිය පිට ඇඳි ඉරක් ලෙද

(සුභාෂිතය)